# සර්ප කුමරිය



එල්. සිළුනි ඕමන්සා ද සිල්වා

# සර්ප කුමරිය

එල්. සිළුනි බිමන්සා ද සිල්වා

සර්ප කුමරිය

කථාව සහ චිත්‍ර

එල්.සිළුනි බිමන්සා

4 ශ්‍රේණිය E

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

කතෘගේ වෙනත් කෘති

රන් සමනලයා

මුහුදු පතුලේ දිය කිඳුරිය

ටීනා , මීනා සහ මායා මුට්ටිය

කෘතිය පළ කරන දිනය

2025 පෙබරවාරි

ISBN අංකය

ISBN – 978-624-208-732-0

# පිදුම

මහමායා බාලිකා විදුහලේ ගරු
විදුහල්පතිතුමියට,

ඇඳුරු මඬුල්ලට

සහ

දයාබර දෙමාපියන්ට
සෙනෙහසින් පිළිගන්වමි.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුගයේ කැපී පෙනෙන්නේද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වර්ෂ ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත් කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරධන අත්තදස්සී මා හිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද ග්‍රන්ථකරනයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක්ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලයේ මහනුවර

එකෝමත් එක කාලෙක පුංචි ගම්මානයක් ඇතුළේ තිබුණ පුංචි කැලෑවක ලස්සනම ලස්සන කුමාරිකාවක් හිටියා. එයාට කවුරුත් පුදුම කරන මායා බලයක් තිබුණා. ඒ වගේම හැමෝම එයාට කීවේ "සර්ප කුමරිය" කියලා. කවුරුත් ඇයට තිබෙන මේ අමුතු මායා බලය ගැන කතා කරන්නට වුණා.

ඔන්න ඉතින් ටික දවසක් යනකොට මේ
රටේ හිටිය කුමාරයෙක්ට මේ
කුමාරිකාවගේ මායා බලය ගැන ආරංචි
වුණා. ඒ කුමාරයා මේ කුමරියව සොයා
ගෙන කැලේ ඇතුලටම ගියා.

ටික දුරක් යනකොට කුමාරයාට විශාල ගල් ගුහාවක් හමු වුණා. නොයෙක් විධියේ වැල් වර්ගවලින් මේ ගල් ගුහාව වැහිලා තිබුණේ. කුමාරයා බයෙන් බයෙන් ගුහාව ඇතුලටම ගියා. වටපිට බලමින් හෙමින් හෙමින් ගුහාව ඇතුලට යන කුමාරයාට ගුහාව ඇතුළේ තැනින් තැන සර්පයන් දකින්න ලැබුණා.

ඒ වගේම ගුහාව ඇතුලේ ලස්සනම ලස්සන කුමාරිකාවක් සිටිනවා ඔහු දුටුවා.



හිතේ තිබුණු බය යටපත් කරගෙන "ඔබ කවුද?" කුමාරයා ඇයගෙන් ඇසුවා. "මම කැලෑ කුමරියයි" කියලා ඇය කුමාරයාට බොරු කිව්වා. "හොද කැලෑ කුමරිය, ඔබ කෙසේද මේ විෂකුරු සර්පයෝ සමඟ බය නැතුව කැලෑවේ සිටින්නේ" කුමාරයා ඇසුවා. එක්වරම කුමරියට කියා ගන්න දෙයක් නැති වුණා. කුමාරයාට තේරුණා ඇය සර්ප කුමරිය බව.

කුමාරයා මෙහෙම ඇසුවා.

"ඔබ සර්ප කුමරිය නේද? මට විතරක් ඇත්ත කියන්න".

කුමරිය කුමාරයාට පිළිතුරු දුන්නා.

"ඔව් ඔව් මම සර්ප කුමරිය තමයි. ඔයා කියන දේ ඇත්ත. මගේ ආරක්ෂාවට මේ ගුහාවේ හැම තැනම සර්පයෝ ඉන්නවා තමයි.

නමුත් මම හරිම බයෙන් ජීවත් වෙන්නේ."

කුමරිය අඩ අඩා කුමාරයාට කිව්වා.

"ඇයි ඔබ බයෙන් ඉන්නේ" කුමාරයා

ඇසුවා. "මම බය මට තියෙන අමුතු බලය ගැන මිනිස්සු දැනගෙන මට කරදර කරයි කියලා." කුමරිය කුමරාට කීවෙත් බයේ ගැහෙමින්. මේ කතාව අහපු කුමාරයාට කුමරිය ගැන දුක හිතුණා.

කුමාරයා ඇයට උදව් කරන්න හිතුවා. ඒත් කුමාරයාගේ හිතටත් ටිකක් බයයි. කුමරිය කුමාරයාට කරුණාවෙන් කතා කළා. "

කුමාරයණෙනි, ඔයාට අදට මගේ මේ ගෙදර ඉන්න පුළුවන්. දැන් හොදටම රෑ

වෙලා. ඒ නිසා ඔයාට කොහේවත්

යන්න බැනේ මේ මහ රෑ."

වෙන කරන්න දෙයක් නැති නිසා

කුමාරයා හිතේ  බය හංගාගෙන ගල්

ගුහාවේ රැය ගත කරන්න කැමති වුණා.

කුමරිය කාටත් නොකියා හොර රහසේම

රෑ කැලෑවට යන්න පිටත් වුණා.

කුමාරයා මේ කදිම අවස්තාව වහාම

ප්‍රයෝජනයට ගත්තා. ඔහු ගුහාව පුරාම

ඇවිදිමින් බැලුවා. ටික වෙලාවකින්

කුමරිය ගුහාවට ආවා.

කුමාරයාට එක්වරම කියාගන්න දෙයක් නැති වුණා. ඔහු නිහඬ ව සිටියා. කුමරියට පුංචි කේන්තියක් ඇති වුණා.



"කුමරිය ඔබ මේ මහ රෑ කොහෙද

ගියේ...?" කුමාරයා ඇහුවේ පුදුමයෙන්.

"මා ඔබට පලතුරු සෙවීමට කැලයට

ගියේ. දැන් ඔබ මේ රසවත් පලතුරු

කන්න." ඇය කීවා.

"ඔබ කන්නේ මොනවාද?" කුමාරයා

කුමරියගෙන් ඇසුවා.

"මම කන්නේ බිත්තර . මම සර්ප

කුමාරියක්නේ." කුමාරිය දුකින් පිළිතුරු

දුන්නා.



කුමාරයාට ගොඩක් දුක සිතුණා. පසුවදා

කුමාරයා, කුමාරිය ඔහුගේ මාළිගයට

රැගෙන ගියා. එතැන් සිට මේ කුමාරයා කුමාරියට ඉතාම ආදරයෙන් සැලකුවා. ඇයට ඉස්තරම්ම වර්ගයේ හොඳ කුකුල් බිත්තර දිනපතා ලබා දුන්නා. කුමරිය කුමාරයාගේ මාළිගාවේ සතුටින් ජීවත් වුණා. ඒ වගේම කුමාරියගේ මායා බලයෙන් රටට ලොකු සේවයක් කළා. රටත් බොහොම දියුණුවට පත් වුණා.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිද පරමාර්ථ ඇතුව 2014 පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනය ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල්, කලාප පළාත් ජාතික හා ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසය එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන් දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපයාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියමක් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයින් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාව ගොඩ නගා දී තිබේ. එම නිසා සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මාගේ සුභාෂින්සන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක

සෙනවිරත්න මහ ලේකම්